**ශීර්ෂය 317 - උතුරු මැද පළාත් සභාව - 2023**

---

01. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ජනතාවකගෙන් පිරිපුන් පළාතක් රටට දායාද කිරීම

1.2 මෙහෙවර

සියලුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ථ උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායකවීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

02. මූල්‍ය ප්‍රකාශන

මුළු ප්‍රතිපාදන හා වියදම

2023 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් 32,515,000,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් 27,977,076,680ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිකර තිබුණු මුදල රු.4,537,923,320 ක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 14 ක් විය.

| වියදම | 2023.12.31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2023.12.31 දිනට උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 28,331,000,000 | 24,970,426,680 | 3,360,573,320 | 12 |
| මූලධන | 4,184,000,000 | 3,006,650,000 | 1,177,350,000 | 28 |
| එකතුව | 32,515,000,000 | 27,977,076,680 | 4,537,923,320 | 14 |

03. විගණන නිරීක්ෂණ

317 ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගතකර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.